


# සංක්‍රමණිකයකුගේ සටහන



**ගුවන් ප්‍රහාර**

පසුගියදා කටුනායකට එල්ල වුණ එල්.ටී.ටී.ඊ. ප්‍රහාරයත් සමග ගුවන් හමුදාව ගැන ජනතාවගේ තිබුන ප්‍රතිරූපය දෙදරුවා. මේ යුද්ධය කියන්නේ අපි බලාපොරොත්තු වෙන විදිහේ එකක් නොවේ. කටුනායකට ගහපු එක ගැටළුවක් නොවේ. යුද්ධයක් වෙනකොට එහෙම තමයි. ගැටළුව වන්-න් ප්‍රහාරයෙන් පසු කොටි නිරුපද්‍රිතව ආපසු යාමයි. ගුවනේ දී සටන් කල හැකි පහසුකම් අපට නැති බව පිලිගත්තත්, කොටින්ට ප්‍රහාරයෙන් පසු ආපසු යාමට ගතවෙන කාල සීමාව තුළ කොළඹ සිට යාපනය දක්වා ඇති හමුදා කඳවුරු තුළ සිටි අයට ප්‍රතිප්‍රහාර එල්ල කරන්නට හැකියාවක් නොතිබුන එක ප්‍රශ්නයක්. ඒ සඳහා ඔවුනට උවමනා තරම් කාලය තිබුණා. යාපනයේ ඉඳලා ඇවිත් හරි යමක් කරන්න තිබුනේ නැද්ද?

මේ යුද්ධ සිදුවන්නේ අමුතු විදිහට. සාම්පූර්, මාවිල්ආරු ජයග්‍රහණ හබරන එක ප්‍රහාරයෙන් අවසන් වෙනවා. වාකරේ කොක්අඩිචොලේ ප්‍රහාරයන්ගේ උද්දාමය කටුනායකින් අවසන්. යුද්ධ පිළිබඳව අප විශාරදයින් නොවූවත් මේ සිදුවීම් පෙලගස්වා බැලුවහොත් අපට යමක් වටහා ගත හැකියි.

හැමදාම යුද්ධයේදී තැලෙන්නේ පහලම සොල්දාදුවන් හා අහිංසක ජනතාවම විතරයි. මේ යුද්ධ ගැන ශ්‍රීපතිල කියන කථා ගැන දැන් ජනතාව දෙවරක් හිතන්න පෙළෙඹෙන්නේ මේ නිසයි. මෙවන් ප්‍රහාරයන් ගැන වගකීම නායකයෝ භාර ගන්නේ වෙන රටවල්වල. ඒ වතුරත් ඉතිං පහලම තැනින් ගලාවි.

**අප්‍රේල් මතකය**

කුරුස ගස් මත - සඳරැස් වැටී බබලන
දඩලු සොහොන් බිම් කඩ
මිනී මල් පිපුන රැයකදී - රිය කවුළු සතු රුසින්
දකින මගේ දුක් සිත
හමන හිරිගඩු පිපුන පවනින්
ගමන් ගති අතීතය වෙත.....
සොයා කඩඉම් එතෙරට - උඩුගං බලා යාමට
දෙගම්බඩ ගැළු වතුරට - පැන්නෙමු සිත් තොසින්
සිත් තුළ නොවූ කපට ....නුඹට මට
අහිමි කරවූ සියළු දෙය උදුරා ගන්නට
පීනුවෙමු - පොර බැදුවෙමු
සම් මස් නහර කකියන - පරාජිත වූ ඒ දින
නුබේ ජීවය මුසු කලා, වා තලයට
පරාජය පරදවාළු අද දින
එමඟ යන මා සිත
ඉව කරනු... සොයනු මට දැනෙයි
නුබෙන් ගිලිහුනු ජීවය.....

යුක්ති ගරුක සාධාරණ ලොවක් ගොඩනැගීමට වෙර දැරීමේදී ප්‍රථමයෙන් දිවි පුද කලවුන් වෙනුවෙ-න් කලකට පෙර සහෘද හිතවතෙකු කල මතක සටහන්....

**සන්නස**

සන්නසට වසර දෙකක් පිරුණා. අදින් දෙවසරකට පෙර මෙවන් බක් මාසයක අප ඇරඹූ ඒ අභියෝගාත්මක දුෂ්කර ගමනේ සැලකිය යුතු දුරක් අප ඇවිත්. අප ඔබ කෙරේ තැබූ විශ්වාසය ඔබ අප කෙරේ දැක්වූ ලැදියාවත් මේ ගමනට පන්නරය වූ බව පැවසිය යුතුමයි.

ගමන ඇරඹුමේදී අප සමග සිටි සො-යුරන් දයාවෙන් සිහිකරන අතර, මේ ගමන නොනැවතී ඔබ හා එක්ව ඉදිරියටම යන බවට සපථ කර සිටිනවා.

**රඟ සොබා**

'ඕස්ට්‍රේලියාව තුළ ශ්‍රී ලාංකික නැටුම් කලාව අරබයා ඇති වී ඇති රසික ප්‍රබෝදය දුටු විට ඇති වුනේ දැඩි සතුටක්.

ජනප්‍රියම චිත්‍රපටයක් හෝ ප්‍රසිද්ධ ගායක ගායිකාවන් ගෙන්වා පවත්වන සංදර්ශනයකදී වුවද ශාලාව පිරී යන තරමට ජනතාව ඇද්දවීම ඉතා අපහසු කාර්යයක් බව අප අත්දැකීමෙන් දන්නවා. ඒත් මාසයක කාලයක් ඇතුළත පැවැත්වූ අපේ ආධුනික ශිල්පීන්ගේ නැටුම් සංදර්ශන දෙක සඳහා දහසක් පැමිනිය හැකි ශාලාව පිරීයාම විශ්මයට කරුණක්. ඒ සඳහා අපගේ ගෞරවය විශ්ව නර්ථන ආයතනයටත්, අමා රංගායතනයටත් හිමිවිය යුතුය.

සාම්ප්‍රදායික නැටුම් කලාව නැති කරන මානයකට ගෙන යාමට ශ්‍රී ලංකාව බොහෝ නව නර්ථන ශිල්පීන් උත්සාහ දරන කාලයක මෙරට අපේ දරුවන්ට සාම්ප්‍රදායික නැටුම් කලාව හා ඒ ඇසුරෙන් කෙරෙන නව නිර්මාණයනට දායකවීමට ඉඩ සැලැස්වීම අගය කල යුතු කරුණක්. මේ සංදර්ශන දෙකම නැරඹූ අපට හැඟී ගියේ කුමන කලාවක් තුලින් වුවද එකිනෙකා පරයා යාමේ පටු හැඟීමෙන් තොරව කොතරම් අසිරිමත් නිර්මාණයන් කල හැකිද යන්නයි.

මේ විශිෂ්ඨ නිර්මාණයන් සඳහා උර දුන් විශ්ව රංගායතනයේ රසිකා කුලසිංහටත්, අමා නර්ථනායතනයේ අමා සිරිවර්ධනටත් අපේ ස්තුතිය.

**අවුරුද්ද**

ලංකාවේ ඉන්න මිත්‍රයෙකුට කථා කලා මෙදා සැරේ අවුරුද්ද ගැන අහන්න. කෙටි උත්තරයක් ලැබුනා. 'යුධ බිය, ජීවත්වීමේ ප්‍රශ්න, කෑම බීම, ඇඳුම් පැළඳුම්, ප්‍රවාහන ප්‍රශ්න, විරැකියාව මේ

*<u>චාරිත්‍ර වාරිත්‍ර සිරිත් ආදිය දැන් තියෙන්නේ ඈපා ලිතෙයි. රූපවාහිනියෙයි, එෆ්.එම්. නාලිකා තුළ විතරයි.</u>*

ආදී දහසක් ප්‍රශ්න වලින් හෙම්බත්වීම නිසාම එකිනෙකා අතර ඇති මානව සම්බන්ධකම් බිඳී ගොස් පරාර්ථය මියගොස් ආත්මාර්ථයම පමණක් මුල් බැස ගෙන ඇති සමාජයට, එකිනෙකා ගැන අනුන් ගැන දවසකට හෝ හිතන්න අනෙකෙකු වෙනුවෙන් යමක් කරන්නට හිතෙන දවස් දෙක තුනක කාලය තමයි අවුරුද්ද කියන්නෙ.

චාරිත්‍ර වාරිත්‍ර සිරිත් ආදිය දැන් තියෙන්නේ ඈපා ලිතෙයි. රූපවාහිනියෙයි, එෆ්.එම්. නාලිකා තුළ විතරයි. ඉතිං කුමක් හෝ අපේ වාසනා-වකට මේ කාලයට සමාජය හොඳ අතට වෙනස් වෙනවා. ඉතිං ඒ නිසා කොහොම හරි මේක රැකගන්න ඕනේ.''බලාගෙන ගියහම ඒ කතාවේ යමක් නැත්තෙත් නැහැ.

**මානව හිමිකම්**

පුවත්පත් ඇතුලු ජනමාධ්‍යයට නිදහස් අදහස් පැවසීමේ අයිතිය ඇහිරෙමින් පවතිනවා. සෘජුව නොවුනත් වක්‍රාකාරව

*<u>මහින්ද රාජපක්ෂට මානව අයිතීන් රැකීමට ඉදිරිපත්වීම ගැන තිබුනේ කීර්තිමත් අතීතයක්. එවකට පැවති රජයේ වැඩිම වෛරයකට ලක්ව සිටි අයෙක් මහින්ද?</u>*

එය ක්‍රියාත්මක වෙනවා. දිනපතා ලංකාව තුළ සිදුවෙන දේ දකින විට මානව හිමිකම් කඩ නොවෙනවා කියා කිසි-වෙකුට කියන්න බැහැ. මානව අයිතීන්වල සිංහල, දෙමළ බේදයක් තිබෙන්න බැහැ.

මතුපිටට එතරම් නොපෙනුනත් රටේ යම් අරාජික තත්ත්වයක් ඇතිවෙමින් තිබෙන බව ඇත්ත. මේ රජය යටතේත් මේව මෙහෙම වෙන්නේ කොහොමද? මහින්ද රාජපක්ෂට මානව අයිතීන් රැකීමට ඉදිරිපත්වීම ගැන තිබුනේ කීර්තිමත් අතීතයක්. එවකට පැවති රජයේ වැඩිම වෛරයකට ලක්ව සිටි අයෙක් මහින්ද? මීට අවුරුදු 15කට පෙර පාද යාත්‍රා කරන අවදියේ මහින්දගේ හොඳ සගයෙක් වුන ඇඹිලිපිටියේ පාදයාත්‍රා සංවිධායකව මරලා ඇස් පවා උගුල්ලා දමා තිබුණා අපට මතකයි. ඒත් අප්‍රේල් මාසයකදීමයි. එලෙසම 88 - 89 කාලයේ සිදුවුන මානව හිමිකම් කඩවීම් ගැන ජාත්‍යන්තරයට කරුණු කියන්න ගිහින් ඡායාරූපත් සමගම ගුවන්තොටේදී අත්අඩංගුවට පත්වුනෙත් මේ මහින්දමයි. ඒ ඔහු සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් ලෙස ඉන්න කාලේ. ඒ ප්‍රගතිශීලි මහින්ද දැන් පූර්ණ බලැති විධායක ජනාධිපතිවරයෙක් වෙලා. ඔහුගේ පාලනය යටතේදීත් ඉතිහාසය පෙර සේම ආපසු කැරකෙන්නට පටන් ගෙන තිබීම සංවේගයට කරුණක්. හැම සිදුවීමකටම යුද්ධය පෙරට ගෙන නිදහස්වීමට තැත් කිරීම මහින්ද වැන්නකුට නොගැලපෙන්නක්.

## මාස්ටර් සර්



*මොකද මන්තිරිතුමා අහස පොළොව ගැටලන්න වගේ කල්පනාවක... ?*

*බලනවකො අයිසෙ..*
*මට කල්පනාවට එන්නෙම නැහැනෙ අද මං ඉන්නේ ආණ්ඩු පක්සෙද විපක්සෙ ද කියලා...*

## කවි කොළය

*රුපියල් කෝටි විස්සක කොටි ගනුදෙනුව*
*හීනෙන් කියනකොට ශ්‍රීපති හිරේ ඉඳන්*
*ඒ විස්තරය හිර කරුවෙකු හට ඇහිලා*
*මෙහෙමයි කරන්නේ ඒ ගැන විවරණය*

*දීලා පගාවක් යහමින් කොටියාට*
*රජකම ගත්ත එක මොන කෙරුවාවක්ද?*
*පින් පඩි ගන්නටත් අල්ලස් පුදන රටේ*
*ජාතික පුරුද්දට කොයි චින්තනෙත් යටයි*

*වෙත්තසිංහ*

සිංහල නවකතා ලෝකයට නව මුහුණුවරක ප්‍රබන්ධයක්...
ළමා මනස වඩවා ගන්නට මාර්ගෝපදේශකයක්...




බ්‍යාමප්‍රභාව
1 සහ 2
ළමයි
හදන්නේ
කොහොම ද?




සූරිය පොත්හලෙන් හා අන්තර්ජාලයේ
www.lankahands.com
වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.
www.dpsdvm.com/AruniShapiro